ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය
இலங்கை பொதுச் சுகாதார பரிசோதகர்கள் சங்கம்
THE PUBLIC HEALTH INSPECTORS' UNION OF SRI LANKA
අංක 673/3, මරදාන පාර, කොළඹ 10 இல. 673/3, மருதானை வீதி கொழும்பு 10.
No. 673/3, Maradana Road Colombo 10, Sri Lanka.
Reg.No. 712
Tel./ Fax - 011-2670759 E -Mail - phisrilanka1@gmail.com Web - https://phi.lk

ලේකම් | ඔබේ අංකය Your No. உமது இல. | මගේ අංකය My No. எனது இல. PHIU/Sec/2026/45 | දිනය Date திகதி 2026-08-19

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය
පූජ්‍ය බද්දේගම විමලවංශහිමි මාවත
කොළඹ 10.

**<u>කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ සෞඛ්‍ය කාර්යාලයේ සිදුවන අනීතික ක්‍රියාවලට එරෙහිවීම හේතුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක B.H. මීගස්දෙනිය මහතා ස්ථානමාරු කිරීම හේතුවෙන් දීපව්‍යාප්ත වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට යොමුවීම.</u>**

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලයේ වසර ගණනාවක සිට සිදුවන දූෂණ අක්‍රමිකතා සහ රාජ්‍ය මුදල් අවභාවිතා කිරීම පිලිබඳව මෙයට පෙර අවස්ථා ගණනාවකදී අප සංගමය විසින් ඔබතුමාව දැනුවත් කර ඇත. (ආසන්නතම දැනුවත්කිරීම අංක PHIU/Sec/2026/42 සහ 2026-07-12 දිනැති ලිපිය)
නමුත් මේ දක්වා එම කරුණු පිලිබඳව කිසිදු ආකාරයක විමර්ශණයක් සිදු නොකිරීම පිලිබඳව අප සංගමයේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.
එමෙන්ම පහත කරුණු පිලිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරමු.

1. ගුවන් තොටුපල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් රාජකාරියේදී අත්අඩංගුවට ගන්නා ආහාර ද්‍රව්‍ය නීතිමය ක්‍රියාමාර්ග අවසන්වීමට පෙර අස්ථානගතවීම පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
2. ඒ පිලිබඳව ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලයේ මාසික රැස්වීමේදී (2026-05-22 දින) කරුණු හෙලිකිරීමේදී කාර්යමණ්ඩලය ඉදිරිපිටදීම කණිෂ්ඨ කාර්යමණ්ඩල සේවකයකු විසින්, කරුණු හෙලිකල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට තර්ජනය කිරීම පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
3. ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලයේ කාර්යමණ්ඩල ප්‍රධානී වෛද්‍ය නිලධාරීයාගේ වැරදි පරිපාලන තීන්දු තීරණ පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
4. ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලයේ සේවයේ නිරත වෛද්‍ය නිලධාරීන් තම සේවා කාලය අතරතුර වෙනත් ආයතන වල මුදලට සේවයකිරීම සහ තම සේවා මුරයතුල සෞඛ්‍ය කාර්යාලයේ රැඳී නොසිටීම හේතුවෙන් උද්ගතව ඇති ගැටළු පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
5. වසර ගණනාවක සිට ගුවන්තොටුපල මහජන සෞඛ්‍ය පරීක්ෂක අංක 3 නිල නිවාසය අවභාවිතා කරමින් රාජ්‍ය මුදල් අපතේ හරිමින් රජයට අනර්තයක් සිදු කිරීම පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
6. ගුවන්යානා ඇතුලත ධූමායන සිදුකරන රසායන ද්‍රව්‍ය බහලුම් අවභාවිතය වැලැක්වීම සඳහා සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය හංසක විජේමුණි මැතිතුමා ලබාදුන් උපදෙස් නොසලකා හරිමින් එම බහලුම් අවභාවිතා කිරීම පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
7. ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලයේ සේවයේ නිරත කලමණාකාර සහකාර සහ කණිෂ්ඨ සේවකයන් සඳහා නීතිවිරෝධි ලෙස අතිකාල සහ දීමනා ලබාදෙමින් රාජ්‍ය මුදල් අවභාවිතා කිරීම පිලිබඳව විධිමත් විමර්ශනයක් සිදුනොකිරීම.
8. **ඉහත සියළු කරුණු පිලිබඳව විරෝධය දැක්වූ ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලයේ ජ්‍යේෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂක B.H. මීගස්දෙනිය මහතා පරිපාලන රීතින්ට පටහැනිව සහ සදාචාර විරෝධීව අත්තනෝමතික ලෙස ස්ථානමාරු කිරීම.**

යන ඉහත කරුණුවලට විරෝධයපා දිවයිනපුරා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පහත සඳහන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට අවතීර්ණවන බව කනගාටුවෙන් දැනුම්දෙමු.

ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය
இலங்கை பொதுச் சுகாதார பரிசோதகர்கள் சங்கம்
THE PUBLIC HEALTH INSPECTORS' UNION OF SRI LANKA
අංක 673/3, මරදාන පාර, කොළඹ 10 இல. 673/3, மருதானை வீதி கொழும்பு 10.
No. 673/3, Maradana Road Colombo 10, Sri Lanka.
Reg.No. 712
Tel./ Fax - 011-2670759 E -Mail - phisrilanka1@gmail.com Web - https://phi.lk

ඔබේ අංකය Your No. உமது இல. } මගේ අංකය My No. எனது இல. } දිනය Date திகதி }

- 2026-08-20 දින සිට දිවයිනේ සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දිවයිනපුරා සියළුම ඩෙංගු මර්ධන රාජකාරීවලින් (ඩෙංගු රෝගීන් විමර්ශනයද ඇතුලත්ව) ඉවත්වීම.
- 2026-08-21 දින දිවයිනේ සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සංකේත වැඩ වර්ජනයක් සිදු කිරීම
- ඉහත කරුණු සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන්ගේ ප්‍රතිචාර අනුව ඉදිරි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග තීරණය කිරීම සහ උක්ත දූෂණ අක්‍රමිකතා සාක්ෂි සහිතව ජනතාවට හෙලිකිරීම මෙන්ම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමද සිදු කරණු ඇත.

එබැවින් **පළමුව උක්ත නිලධාරියා නැවත පෙර සිටි සේවා ස්ථානයේ සේවයේ පිහිටුවන ලෙසත්**, අනතුරුව ඉතිරි කරුණු සම්හන්ධයෙන් විමර්ශණ කටයුතු සිදුකරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමු.

උපුල් රෝහණ
ගරු සභාපති වැ/බ

චමිල් මුතුකුඩ
ගරු ලේකම්

ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය

පිටපත් -

1. අතිරේක ලේකම් පාලන ii - අ.ක.ස.
2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - අ.ක.ස.
3. අධ්‍යක්ෂ නිරෝධායන - අ.ක.ස.
4. අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්ධන ඒකකය - කා.දැ.ස.
5. අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය කළුතර - කා.දැ.ස.
6. සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස.
7. සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස.
8. සියළුම විශේෂිත රෝග ව්‍යාපාර ප්‍රධානීන් - කා.දැ.ස.
9. සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් - කා.දැ.ස.
10. සියළුම ආයතන ප්‍රධානීන් - කා.දැ.ස.

Hony President/Act
M.G.Upul Rohana
Tel: 071 44 16872
Email: mgurohana@gmail.com

Hony Secretary
C.S. Muthukuda
Tel: 077 3161489/ 071 4877381
Email: chamilmuthukuda@gmail.com

Hony Treasurer
M.A.C.Prasad
Tel: 070 3998686
Email: macprasad123@gmail.com